# An Investigative Study of the wrong viewers in time of Buddha Revealed by the *Brahmajāla Sutra*

## දීඝනිකාය බ්‍රහ්මජාල සූත්‍රය හා එහි අන්තර්ගත මිත්‍යා දෘෂ්ටි පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

Karapikkada Sobitha

කරපික්කඩ සෝභිත හිමි

බුද්ධ පරිනිර්වාණයෙන් අනතුරුව සිදු වූ ධර්ම සංගායනාවන්ගේ ප්‍රතිඵල ලෙස පසුකාලීනව සමස්ත බුද්ධ වචනය සූත්‍ර, විනය, අභිධර්ම ලෙස කොටස් වශයෙන් සංග්‍රහ වූ බව වංශකතා තුළ දැක්වේ. මෙකී කාණ්ඩයන් අතුරින් බුද්ධ දේශිත සියලු සූත්‍ර දේශනා රැස්කොට සංග්‍රහ වූ සූත්‍ර පිටකය නැවත දීඝ නිකාය, මජ්ඣිම නිකාය, සංයුක්ත නිකාය, අංගුත්තර නිකාය, ඛුද්දක නිකාය වශයෙන් පඤ්ච නිකායකට එහි ප්‍රමාණය හා සංයුතිය සළකා ඇතුළත් කරන ලදී. මෙහි ඉතා දීර්ඝ වූ සූත්‍ර ධර්ම ඇතුළත් කාණ්ඩය දීඝ නිකාය ලෙස දැක්වේ. එවන් දීර්ඝ වූ සූත්‍ර දේශනා 34ක් මෙම නිකායට ඇතුළත් ය. එම සූත්‍රයන් ද නැවත සීලක්ඛන්ධ වග්ග, මහා වග්ග, පාටික වග්ග යනුවෙන් කොටස් 03ක් යටතේ සංග්‍රහ කොට ඇත. මෙහි සීලක්ඛන්ධ වග්ගයට සූත්‍ර 13ක් ද, මහා වග්ගයට සූත්‍ර 10ක් ද, පාටික වග්ගයට සූත්‍ර 11ක් ද ඇතුළත් වේ. සීලක්ඛන්ධ වග්ගයට අයත් සූත්‍ර දේශනාවන් අතර පළමු සූත්‍රය බ්‍රහ්මජාල සූත්‍රය යි. මෙම සූත්‍රය ''බ්‍රහ්මජාල'' යනුවෙන් හඳුන්වා ඇති නමුදු ධර්ම සාහිත්‍යය තුළ එයට තවත් පරියාය පද කීපයක් හමුවේ. එනම්,

- ❖ අත්ථජාල - මෙලොව පරලොව අර්ථ සිද්ධිය විවරණය වන බැවින්
- ❖ ධම්මජාල - බුද්ධ වචනය නිරන්තරයෙන් භාවිත වන බැවින්
- ❖ බ්‍රහ්මජාල - උසස් වූ සබ්බඤ්ඤුත ඥානය ගැන පැවසෙන බැවින්
- ❖ දිට්ඨිජාල - දෙසැටක් මිථ්‍යා දෘෂ්ටි බැහැර කොට විවරණය වන බැවින්
- ❖ අනුත්තරසංගාමවිජය - මෙම ධර්මය ඇසීමෙන් දෙවපුත්ත මාර, මච්චුමාර, ක්ලේෂමාර යන මරුන් මර්දනය කළ හැකි බැවින්

මේ සූත්‍රය තුළින් බුදුරජාණන් වහන්සේ දෙසැටක් වූ මිථ්‍යා දෘෂ්ටි ප්‍රතික්ෂේප කරන විට දෙසැට වතාවක් පොළොව කම්පා වූ බව දැක්වේ. එසේම මෙම සූත්‍රයෙහි ''බ්‍රහ්ම'' යන්නෙන් ''විශාල'' යන අරුත ද ''ජාල'' යන්නෙන් ''දැල'' යන්න අරුත ද දැක්වෙන අතර, එම නිසා "මිථ්‍යා දෘෂ්ටි සියල්ල හසුවන දැල" යන නමින් ද මෙය ව්‍යවහාර වේ.

## බ්‍රහ්මජාල සූත්‍රාගත ආදි නිධානය

බුදුරජාණන් වහන්සේ රජගහනුවර සිට නාලන්‍දාවට වඩින අවස්ථාවේ දී සුප්පිය නම් පරිබ්‍රාජකයා සහ ඔහුගේ අතවැසි බ්‍රහ්මදත්ත එම මාර්ගයේ ම ගමන් කළේ ය. මෙහි දී සුප්පිය තෙරුවන්ගේ අගුණ ප්‍රකාශ කළ අතර, බ්‍රහ්මදත්ත මානවකයා තෙරුවන් ගුණ ප්‍රකාශ කළේ ය. එදින රාත්‍රියේ දී මොවුන් දෙදෙනා ද බුදුරදුන් රාත්‍රිය ගතකළ අම්බලට්ඨිකා නම් උයනෙහි රජගෙය තුළ නවාතැන් ගත් අතර, එහිදී ද තෙරුවන් ගුණ-අගුණ කියමින් ඔවුහු වාද කොට ගත්හ. මෙය ඇසූ භික්ෂූන් දම්සභා මණ්ඩපයේ දී මෙම පුවත සාකච්ඡා කළ අතර, එතැනට වැඩම කළ බුදුරජාණන් වහන්සේ මේ සූත්‍ර දේශනාව පවත්වා ඇත.[ස]

## අන්තර්ගතය

සූත්‍රය ආරම්භයේ දී ම දක්නට ලැබෙන්නේ බුදුරජාණන් වහන්සේ භික්ෂූන් වහන්සේලාට ලබා දෙන්නා වූ උපදේශයකි. එනම්, ***''මමං වා භික්ඛවෙ පරෙ අවණ්ණං භාසෙය්‍යුං, ධම්මස්ස වා අවණ්ණං භාසෙය්‍යුං, සඞ්ඝස්ස වා අවණ්ණං භාසෙය්‍යුං, තත්ත තුමෙහි න ආඝාතො න අප්පච්චයො න චෙතසො අනභිරද්ධි කරණීයා....''***

***''මමං වා භික්ඛවෙ පරෙ වණ්ණං භාසෙය්‍යුං, ධම්මස්ස වා අවණ්ණං භාසෙය්‍යුං, ධම්මස්ස වා වණ්ණං භාසෙය්‍යුං, සඞ්ඝස්ස තුම්හෙහි න ආනන්‍දො න සොමනස්සං න චෙතසො උබ්බිලාවිතත්තං කරණීයං....'***[සස]

(මහණෙනි, යමෙක් බුදුන්ගේ හෝ ධර්මයේ හෝ මහා සංඝයාගේ නුගුණ කියන්නේ ද එහි දී ඔබලා කෝප නොකළ යුතුය. නොසතුට නොඉපදිය යුතුය. සිතේ අමනාප බවක් ඇති නොකළ යුතුය.

එසේම යමෙක් බුදුන්ගේ, ධර්මයේ හෝ මහා සංඝයාගේ ගුණ වර්ණනා කෙරේ ද එහි දී ඔබලා සතුට, සොම්නස, සිත ප්‍රීතියෙන් පිනා යෑම නොකළ යුතුය. ඔබලා එසේ කළවිට එය ඔබලාටම අන්තරාය පිණිස පවතී. එම නිසා තෙරුවන් ගුණ-අගුණ නිවැරදිව තේරුම්ගෙන තමන්ට අදාළ නැති ගුණ-අගුණ බැහැර කොට, අදාළ දේ පමණක් සිතා කටයුතු කරන්න.)

මෙහි දී බුදුරජාණන් වහන්සේ යමෙක් තථාගතයන් වහන්සේගේ ගුණ ප්‍රකාශ කරනු ලබන්නේ ද ඔහු එය ප්‍රකාශ කරනු ලබන්නේ අල්පමාත්‍ර වූ, (***අප්පමත්තකං***) ස්වල්ප මාත්‍රක වූ, (***ධරමත්තකං***) තථාගත ගුණ පිළිබඳ සළකා පමණක් බව දක්වා ඇත. එනම් ඔහු තථාගතයන් වහන්සේගේ සීලය පමණක් (***සීලමත්තකං***) සළකා එම ගුණ වර්ණනා කරන බවයි. මෙයින් අනතුරුව මෙම සූත්‍රයේ විග්‍රහවන කරුණු අවස්ථා 03ක් යටතේ දැක්වේ.

01 චූල සීලය

02 මජ්ඣිම සීලය

03 මහා සීලය

මෙහි පළමු හා දෙවන සීලයන් තුළින් බුදුරදුන්ගේ පවත්නා බාහිර ස්වරූපී වූ අන්‍යයන් විසින් දක්වන ලද සීල ස්වභාවය විස්තර වන අතර, මහා සීලය තුළින් බුදුන් වහන්සේ විසින් ම දත් සෙසු අය විසින් ඉතා අපහසුවෙන් අවබෝධ කටයුතු වූ ඉතා ගැඹුරු ධර්ම දර්ශනයක් අර්ථවත් වේ. එනම් දෙසැටක් වූ මිථ්‍යා දෘෂ්ටි පිළිබඳ විග්‍රහයයි.

## චූල සීල

පාණාතිපාතයෙන් වැළකී, බහා තබන ලද දඬු ඇතිව, දයාවෙන් යුතුව සියලු සත්වයන්ට හිතැතිව වෙසේ. අදින්නාදානයෙන් වැළකී එය අත්හැර දෙන දෙයම බලාපොරොත්තු වන්නේ, සොරකමින් තොරව වෙසෙයි. අබ්‍රහ්මචරියාව අතහැර ග්‍රාම්‍ය ධර්මයක් වූ මෛතුන සේවනයෙන් බැහැරව වෙසෙයි. මුසාවාදය අත්හැර ඉන් වැළකී සත්‍යය ම ප්‍රකාශ කරමින් වෙසෙයි. කේළාම් වචන අතහැර ඉන් වැළකී සාමග්‍රී වචනයෙන් වෙසෙයි. පරුෂ වචන අතහැර බොහෝ ජනයාට ප්‍රිය වූ කර්ණ රසායන වචනයෙන් වෙසෙයි. හිස් වචන අත්හැර අර්ථ සහිත වචනයෙන් වෙසෙයි. තව ද පැළ වන දෑ, පැළ වුණු දෑ සිඳීමෙන්, බිඳීමෙන් වැළකුණේ ද වේ. පෙරබත් කිස වළඳා විකල් බොජුනෙන් වැළකුණේ වෙයි. නැටීම්, ගැයීම්, වැයීම් ආදී විසූක දර්ශනයන්ගෙන් තොරව වෙසෙයි. ඇඟ අඩුතැන් පිරවීමෙන් ද, ඇඟ සරසන මල් ගඳ ආදිය දැරීමෙන් ද, උසසුන් මහ අස්නෙන් හිඳීමෙන් ද, රන් රිදී මසු කහවණු පිළිගැනීමෙන් ද, අමු මස් පිළිගැනීමෙන් ද, ස්ත්‍රීන් කුමාරිකාවන් පිළිගැනීමෙන් ද, දාස දාසියන් පිළිගැනීමෙන් ද, එළු බැටළුවන් පිළිගැනීමෙන් ද, කුකුළන්, ඌරන් පිළිගැනීමෙන් ද, ඇතුන්, මී හරක්, අශ්ව වෙළඹාදින් පිළිගැනීමෙන් ද, කෙත්වතු පිළිගැනීමෙන් ද, ගිහියනට දූත මෙහෙවර කිරීමෙන් ද, ගෙන් ගෙට පණිවිඩ යැවීමෙන් ද, වෙළෙඳ ගණුදෙනුවෙන් ද, හොර තරාදි කිරුමෙන් ද, බොරු රන් ආදිය පෑමෙන් ද, හොර මිණුම්වලින් මිනුමෙන් ද, අල්ලස් ගෙන නිවැරදියන් වැරදිකරුවන් කිරීමෙන් ද, නොයෙක් උපායෙන් අනුන් රැවටීමෙන් ද, වටිනා දෙයට නොවටිනා දෙයකින් රැවටීමෙන් ද, යනාදී මෙවැනි සියලු කපටිකම්වලින් වැළකී වසයි. තව ද අත් පා සිඳීම්, මැරීම්, මං පැහැරීම් ආදී සැහැසිකම්වලින් තොරව දිවි ගෙවයි.[සසස] මෙසේ චූල සීලයට අදාළව බුද්ධ ගුණයන් සූත්‍රය තුළ දක්වා ඇත.

## මජ්ඣිම සීල

හිඟුරු ආදි පැළවන මුල් ද, නුග ආදී පැළ වන කඳ ද, උක්, උණ ආදී පැළවන පුරුක් ද, ඉරිවේරිය ආදී පැළවන දළු ද, වී ආදී පැළවන ඇට ද, යනාදී පැළවුණු පැළවෙන සියලු දෑ බිඳීමෙන් තැලීමෙන් වැළකුණේ ය. කෑම, බීම, වස්ත්‍ර, රිය ගැල්, පාවහන්, යහන්, සුවඳ දෑ, තල, සහල් ආදී දෑ රැස්කර තබාගැනීමෙන් වැළකුණේ වෙයි. තව ද ජන සමූහයා ඉදිරියේ දක්වන නැටුම් හා හරතාදි කතා

ඇසුම්, බෙර ගැසීම් (ලොහොබෙර), අත්තල ගැසීම්, තාලම්පට ගැසීම්, හෝමළ සිරුරු නැඟිටුවීම්, බෙර වැයීම්, දේවතාවන්ට ස්තෝත්‍ර ලෙස කරන නාන්දීගීත ගායනා නොකිරීම්, අයොගුළ ක්‍රීඩා, උණ ගස් ඔසවා කරන ක්‍රීඩා, මළවුන්ගේ ඇටවලට සුවඳ කවා ඒවා වට සිට කරන ක්‍රීඩා, ඇතුන් අසන් පිට නැග කැන යුද්ධ, ඇත් අස් කුකුළු ගොන් බැටළු වටුපොර ආදිය ද, පොලු හරඹ, මල්ලව පොර, යුධ පවත්නා තැන් දක්නට යෑම්, බලසේනා ගණින තැන් දක්නට යෑම, බල සේනා බෙදන තැන්, බල ඇණි, දක්නට යෑම් ආදි විසූක දර්ශනයන් නැරඹීමෙන් වැළකුණේ වෙයි.

එසේම කැට දැමීමෙන් කරන්නා වූ ක්‍රීඩාවන් ද, අහස් කෙළිය, මඩුලු පැනුම, දාදු කෙළිය, කල්ලි ගැසුම, ලග අත් කෙලිය, කොළ නලා පිඹීම, බඩ පිහිනුම් ගැසීම, කොළ නැලියෙන් වැලි මැනීම, කුඩා රියවල් පැදවීම, සිතු දෑ කීම, විකලාංග අනුකරණය කිරීම, ආදි වූ සූදුවට අයිති වූ යැයි සම්මත මේ ඈ ක්‍රීඩාවල් වලින් වැළකුනේ වෙයි. තව ද එළු ලෝම සහිත ඇතිරිය, එළු ලෝම වලින් කරන ලද සුදු ඇතිරිය, රන් නූල් වලින් කරන ලද ඇතිරිය, නිළියන් දහසය දෙනෙකුට පමණ සිට නැටිය හැකි දිගු එළුලොම් මුවා ඇතිරිය, ඇතුන් අසුන් පිට එළන ඇතිරිය, ආදිය ද හිසට පා වලට රතු කොට්ට තබා උඩුවියන් සහිත මහාර්ඝ යහන ආදි වූ උස් යහන් මහ සයන් පරිහරණයෙන් වැළකුනේ වෙයි.

තව ද අත් පා ආදිය මනාව සකස්කර ගැනීම පිණිස තෙල් ගා සම්භාහනය කිරීම, සුවඳ දියෙන් නැවීම, උරහිස්වල මස් වැඩෙන්නට මුගුරෙන් තැලීම, කැඩපතින් මුහුණ බැලීම, ඇඟ වර්ණය වැඩිකිරිමට අඤ්ජන තැවරීම, හස්තාභරණ දැරීම, විසිතුරු සැරයටි දැරීම මේ දෑ තමන් සරසන්නා වූ නන් දේවල් පරිහරණයෙන් වැළකුණේ වෙයි. තවද රාජකතා, චෞර කතා, මහාමාත්‍ය කතා, පාන කතා, ග්‍රාම කතා, ස්ත්‍රී කතා යනාදී වූ අරුත් සුන් කතාවලින් වැළකුණේ වෙයි. එසේම මම මේ දහම දනිමි. ඔබ නොදනිහි. මම නිවැරදිව සිටිමි. ඔබ වැරදි සහිතව සිටිහි. මා කරුණු සහිතව ඇත. ඔබ කරුණු රහිතව ය. ආදී එකිනෙකා අතර බැණ දොඩා ගැනුම්වලින් වැළකුණේ වෙයි. තවද මෙහි එන්න. අසවල් තැනට යන්න, මෙය ගෙන එන්න, මෙය අසවල් තැනට ගෙන යන්න යනාදී රාජ්‍ය, ඇමති, බ්‍රාහ්මණ වූ රාජකුමාරවරුන්ගේ දූත මෙහෙවරින් වැළකුණේ වෙයි. තවද කුහකකම්වලින් ද, අනුන් රැවටීම සඳහා කරන චාටුබස්වලින් ද ලාභ අපේක්‍ෂාවෙන් අන් අයට ගැරහීම් ආදී මේවායින් ද වැළකුණේ වෙයි.[සඩ] මේ මජ්ඣිම සීල තුළින් පෙනෙන්නා වූ තෙරුවන් ගුණ ය.

**මහා සීල**

මෙහි දී බුද්ධ කාලීන භාරතීය සමාජයේ වූ දෙසැටක් මිථ්‍යා දෘෂ්ටි පිළිබඳ විග්‍රහයක් දක්නට ඇත.

**මිත්‍යා දෘෂ්ටිකයන් 62**

පූර්වාන්ත කල්පිකවාද (18) → 05

| | |
|---|---|
| 01. ශාස්වතවාද | 04 |
| 02. ඒකත්‍ය ශාස්වතවාද | 04 |
| 03. අන්තානන්තවාද | 04 |
| 04. අමරා වික්ෂේපවාද | 04 |
| 05. අධිත්‍ය සුමුත්පන්නවාද | 02 |
| | **18** |

අපරාන්ත කල්පිකවාද (44) → 05

| | |
|---|---|
| 01. සඤ්ඤීවාද | 16 |
| 02. අසඤ්ඤීවාද | 08 |
| 03. නෙවසඤ්ඤීනාසඤ්ඤීවාද | 08 |
| 04. උච්ඡේදවාද | 07 |
| 05. දිට්ඨධම්මනිබ්බාණවාද | 05 |
| | **44** |

**පූර්වාන්ත කල්පිකය**

පූර්වාන්ත කල්පිකය ලෙස සලකනු ලබන්නේ පුද්ගලයාගේ අතීතය පිළිබඳ සළකා ඉදිරිපත් කරනු ලබන දෘෂ්ටි මතයන් ය. එනම් නොයෙක් ඥානාධිගමයන් පදනම් කොටගෙන පූර්ව භව පිළිබඳ පමණක් විමසා ලෝකයේ හා ආත්මයේ පැවැත්ම පිළිබඳ මත ඉදිරිපත් කිරීමයි. මෙබඳු දෘෂ්ටි 18 කි.

**01) ශාස්වතවාද 04**

"ශාස්වතවාදය" යනු යම් චිත්ත සමාධියක් ඔස්සේ පූර්ව ජාති සිහි කොට ආත්මයත්, ලෝකයත් සදාකාලික බව දැක්වීමයි. එබඳු වූ ආත්මය එල උත්පාදනයෙන් තොර බවත්, නිශ්චල බවත්, ඉන්ද්‍රඛීලයක් සේ ස්ථිර බවත් සලකා ඒ සත්‍වයෝ ම භවයෙන් භවයට ගමන් කරනු ලබන බවත් දැක්වීම යි.''**සස්සතො අත්තා ච ලොකො ච වඤ්ඣො කූටට්ඨො එසිකට්ඨායිට්ඨිතො තෙව සත්තා සන්ධාවන්ති සංසරන්ති චවන්ති උප්පජ්ජන්ති අත්ථිත්වෙව සස්සති සමං''**[ඞ]මෙබදු වාද සතරකි.

01. ජාති ශතසහස්‍රයෙක පූර්වානුස්මෘතිය විමසා ආත්මය ශාස්වත යැයි දැක්වීම.

02. කල්ප දසයෙක පූර්වානුස්මෘතිය විමසා ආත්මය ශාස්වත යැයි දැක්වීම.

03. කල්ප සතළිසෙක පූර්වානුස්මෘතිය විමසා ආත්මය ශාස්වත යැයි දැක්වීම.

04. බුද්ධිය හා බහුශ්‍රැතය පදනම් කොටගෙන පූර්වානුස්මෘතිය විමසා ආත්මය ශාස්වත යැයි දක්වීම.

මෙම වාද හතරෙන් පළමු වාද තුන අනුභූතිවාදී දෘෂ්ටීන් ය. එනම් පුබ්බේනිවාසානුස්සති ඥානය පදනම් කොටගෙන පෙර ආත්මයන් පිළිබඳ අත්දැකීම් ලබා ඉදිරිපත් කරනු ලබන මතයන් ය. එසේම හතරවන දාෂ්ටිය බුද්ධිවාදී පදනමක් දරා ඇත. එනම් තර්කය හා වීමංසනය පදනම් කොටගෙන තිබීම යි.

**02) ඒකත්‍ය ශාස්වතවාද 04**

මෙයට අනුව පූර්ව භව සිහිපත් කොට ආත්මයෙහි හා ලෝකයෙහි කොටසක් ශාස්වතය, කොටසක් අශාස්වත යැයි ප්‍රකාශ කරනු ලබයි. මෙය ද දෘෂ්ටි 04කින් යුක්ත වන අතර, පළමු තුන අනුභූතිය ද, අවසාන දෘෂ්ටිය බුද්ධිය ද පදනම් වේ.

01. ලොව පහළ වූ පළමු පුද්ගලයා ලෙස දක්වෙන බ්‍රහ්ම ශාස්වතයැයි ද අනෙක් සියල්ලෝ අශාශ්වත යැයි ද සැළකීම.

02. ක්‍රීඩා ලෝලී වූ බ්‍රහ්මවරු ආහාර නොගැනීම් නිසා දිව්‍ය ලොවින් චුතව මෙහි පැමිණ, තමන් අශාශ්වතයැයි ද අනෙක් පිරිස ශාශ්වතයැයි ද සැළකීම.

03. කෝප සිතිවිලි පදනම්ව දිව්‍ය ලොවින් චුතව මෙහි පැමිණ, තමන් අශාශ්වතයැයි ද අනෙක් පිරිස ශාශ්වතයැයි ද සැළකීම.

04 තර්කය පදනම් කොටගෙන ලොවෙහි ඇතැම් කෙනෙකු අනිත්‍ය ලෙස ද ඇතැම් කෙනෙකු නිත්‍ය ලෙස ද සැළකීම.

**03) අන්තානන්තවාද 04**

භාවනාව මගින් සිත දියුණු කොට ලබන්නා වූ ඥානාධිගමයක් පදනම් කොටගෙන ලෝකය පිළිබඳ අන්තවත්ය, අනන්තවත්ය, යනුවෙන් කරනු ලබන මිත්‍යා දෘෂ්ටි හතරක් මෙයින් දක්වේ. මෙහි පළමු 03 අනුභූතිවාදි වන අතර, අවසාන 01 බුද්ධිවාදී වේ.

01. ධ්‍යාන වඩා තමන් වැඩූ කසිණ ලෝකය ම ලෝකය යැයි ගෙන ලෝකය අන්තවත්ය, සීමා සහිත යැයි දෘෂ්ටි ගනියි.

02. සක්වළ තෙක් ප්‍රතිභාග නිමිති වඩා එම කසිණ ලෝකයම ලෝකයැයි ගෙන ලෝකය අනන්තය, අපරියන්තයැයි දෘෂ්ටි ගනියි.

03. ධ්‍යාන ලාභියෙක් ප්‍රතිභාග නිමිත්ත උඩින් හා යටින් නොවඩා සරසින් වඩා එය ලෝකය යැයි ගෙන ලෝකයෙහි කෙළවරක් නැතැයි අනන්ත සංඥීව අත්දැකීම් අනුව එම දෘෂ්ටි ගනියි.

04. තර්කයට බැස කෙනෙක් මේ ලෝකය අන්තවත් ද නොවේ, අනන්තවත් ද නොවේ යැයි දෘෂ්ටි ගනිති.

**04) අමරාවික්ෂේපවාදය**

මෙය සංශයවාදයකි. හෙවත් මේ තුළ අර්ථවත් වනුයේ ප්‍රශ්නයෙන් මඟහැර යෑමයි. ආදා න්‍යාය ලෙස ද මෙය හඳුන්වයි. එහි ක්‍රමයන් හයකි.

01. මෙසේත් මාගේ පිළිගැනීමක් නොමැත.

02. එසේත් මාගේ පිළිගැනීමක් නොමැත.

03. අන් ලෙසකින් ද මාගේ පිළිගැනීමක් නොමැත.

04. නොපිළිගැනීමක් ද මාගේ නොමැත.

05. නොපිළිගැනීමක් මට නැත්තේ ද නොවේ.

**05) අධිච්චසමුප්පන්නවාදය**

අධිච්චසමුප්පන්නවාදය යනු ලෝකයත් ආත්මයත් ඉබේම හේතු ප්‍රත්‍ය රහිතව ආකස්මිකව හටගන්නේ යැයි දැක්වීමයි. (***අධිච්චසමුප්පන්නන්ති ආකාරණසමුප්පන්නං***) මෙබඳු දෘෂ්ටි දෙකකි.

01 අසංඥ බ්‍රහ්ම ලොවෙන් චුතව, මනුෂ්‍ය ලොවෙහි උපන් පුද්ගලයෙකු තම අතීතය සිහිකෙරනුයේ අසංඥී බැවින් කිසිවක් ඔහුට නොපෙනෙයි. එබැවින් ඔහු සත්වයා අහේතුකයැයි ද ඉබේ හටගත්තකැයි ද දෘෂ්ටි වැළඳ ගනියි.

02 තර්කය පදනම්ව දෘෂ්ටි ගතයන්ට එල්බගත් අයෙක් පූර්ව හේතු, වර්තමාන හේතු, අනාගත හේතු නොදකින්නේ අයොනිසොමනසිකාර බහුල හෙයින් සත්තවයා අධිච්චසමුප්පන්නයැයි දෘෂ්ටි එල්බ ගනියි.

මෙසේ මෙම 18 දෘෂ්ටීන් අතර, අනුභූතිවාදී දෘෂ්ටි 13 ක් ද, බුද්ධිවාදී දෘෂ්ටි 05 ක් ද හඳුනාගත හැකිය.

## අපරාන්ත කල්පිකය

අපරාන්ත කල්පිකය යනු යම් ඥානාධිගමයක් පදනම් කොටගෙන අනාගතය පිළිබඳ විමසා බලා ආත්මය හා ලෝකය පිළිබඳ ඉදිරිපත් කරන්නා වූ දෘෂ්ටි මතවාදයන් ය. මේවා 44කි.

**01) සඤ්ඤීවාද 16**

අනාගතය දෙස බලා මරණින් මතු ආත්මය සංඥාව ඇත්තක් ලෙස පිළිගැනීම සඤ්ඤීවාද නම් වේ.

01. රූපි ආත්මය නිත්‍යයැයි සංඥීයැයි දෘෂ්ටි ගැනීම.

02. රූපි ආත්මය නිත්‍යයැයි සංඥීයැයි දෘෂ්ටි ගැනීම.

03. රූපි ද අරූපි ද ආත්මය නිත්‍යයැයි සංඥීයැයි දෘෂ්ටි ගැනීම.

04. රූපී ද නොවන අරූපී ද නොවන ආත්මය නිත්‍යයැයි සංඥීයැයි දෘෂ්ටි ගැනීම.

05. අන්තවත් ආත්මය නිත්‍යයැයි සංඥීයැයි දෘෂ්ටි ගැනීම.

06. අනන්තවත් ආත්මය නිත්‍යයැයි සංඥීයැයි දෘෂ්ටි ගැනීම.

07. අන්තවත් ආත්මය මෙන්ම අනන්තවත් ආත්මය නිත්‍යයැයි සංඥීයැයි දෘෂ්ටි ගැනීම.

08. අන්තවත් නොවූ ආත්මය ද අනන්තවත් නොවූ ආත්මය ද  නිත්‍යයැයි සංඥීයැයි දෘෂ්ටි ගැනීම.

09. ආත්මය එකත්ව සංඥීයැයි දෘෂ්ටි ගැනීම.

10. ආත්මය නානත්ව සංඥීයැයි දෘෂ්ටි ගැනීම.

11. ආත්මය පරිත්ත සංඥීයැයි දෘෂ්ටි ගැනීම.

12. ආත්මය අප්‍රමාණ සංඥීයැයි දෘෂ්ටි ගැනීම.

13. ආත්මය ඒකත්ත සුඛී සංඥීයැයි දෘෂ්ටි ගැනීම.

14. ආත්මය ඒකත්ත දුක්ඛී සංඥීයැයි දෘෂ්ටි ගැනීම.

15. ආත්මය සුඛ දුක්ඛී සංඥීයැයි දෘෂ්ටි ගැනීම.

16. ආත්මය අදුක්ඛී අසුඛී සංඥීයැයි දෘෂ්ටි ගැනීම.

**02) අසඤ්ඤීවාද 08**

ආත්මය මරණින් මතු සඤ්ඤාව නොමැති බව දැක්වීම මේ තුළින් සිදු වී ඇත.

01. රූපී ආත්මය නිත්‍යය මරණින් මතු අසංඥීය.

02. අරූපී ආත්මය නිත්‍යය මරණින් මතු අසංඥීය.

03. රූපී ද අරූපී ද ආත්මය නිත්‍යය මරණින් මතු අසංඥීය.

04. රූපී ද නොවන අරූපී ද නොවන ආත්මය නිත්‍යය මරණින් මතු අසංඥීය.

05. අන්තවත් ආත්මය නිත්‍යය මරණින් මතු අසංඥීය.

06. අනන්තවත් ආත්මය නිත්‍යය මරණින් මතු අසංඥීය.

07. අන්තවත්වූ ද අනන්තවත්වූ ද ආත්මය නිත්‍යය මරණින් මතු අසංඥීය.

08. අන්තවත් නොවූ ද අනන්තවත් නොවූ ද ආත්මය නිත්‍යය මරණින් මතු අසංඥීය.

**03) නෙවසඤ්ඤානාසඤ්ඤීවාද 08**

ආත්මය විසින් මතු සඤ්ඤා ඇත්තේ ද නොවේ. නැත්තේ ද නොවේයැයි ගත් අටවැදෑරුම් දෘෂ්ටි මේ තුළ දක්වේ.

01. රූපී ආත්මය නිත්‍යය මරණින් මතු නෙවසඤ්ඤී නාසඤ්ඤීය.

02. අරූපී ආත්මය නිත්‍යය මරණින් මතු නෙවසඤ්ඤී නාසඤ්ඤීය.

03. රූපී ද අරූපී ද ආත්මය නිත්‍යය මරණින් මතු නෙවසඤ්ඤී නාසඤ්ඤීය.

04. නෙවරූපී නාරූපී ආත්මය නිත්‍යය මරණින් මතු නෙවසඤ්ඤී නාසඤ්ඤීය.

05. අන්තවත් ආත්මය නිත්‍යය මරණින් මතු නෙවසඤ්ඤී නාසඤ්ඤීය.

06. අනන්තවත් ආත්මය නිත්‍යය මරණින් මතු නෙවසඤ්ඤී නාසඤ්ඤීය.

07. අන්තවත් ද අනන්තවත් ද ආත්මය නිත්‍යය මරණින් මතු නෙවසඤ්ඤී නාසඤ්ඤීය.

08. නෙව අන්තවත් නානන්තවත් ආත්මය නිත්‍යය මරණින් මතු නෙවසඤ්ඤී නාසඤ්ඤීය.

**04) උච්ඡේදවාද 07**

මොවුන් මරණයෙන් මතු ආත්මයේ පැවැත්මක් අවධාරණය නොකර යි. මරණයෙන් පසු ආත්මයේ විනාශයක්, සිඳීයාමක්, අභාවයක් පමණක් අර්ථවත් කරනු ලබයි.

01. දෙමාපියන් නිසා උපන්, සතරමහා භූතයන්ගෙන් සෑදුණු, මේ රූප කාය මරණින් මතු විනාශයට යේ යැයි කෙනෙක් උච්ඡේද දෘෂ්ටි ගනිති.

02. තව කෙනෙකු එය ප්‍රතික්‍ෂෙප කරති. කබලිංකාර ආහාර අනුභව කරන දිව්‍යාත්මයෙන් පසුව විනාශයට යේ යැයි කෙනෙක් උච්ඡේද දෘෂ්ටි ගනිති.

03. තව කෙනෙකු එය ද ප්‍රතික්ෂේප කරති. මනෝමය රූපි දිව්‍ය ආත්මයෙක් ඇත, ඉන් චුතව විනාශයට යේ යැයි කෙනෙක් උච්ඡේද දෘෂ්ටි ගනිති.

04. එය ද ප්‍රතික්ෂේප තව කෙනෙකු රූප සංඥා සමතික්‍රමණය කොට ආකාසානඤ්චායතනයට එළඹ, ඉන් චුතව විනාශයට යේ යැයි කෙනෙක් උච්ඡේද දෘෂ්ටි ගනිති

05. එය ද ප්‍රතික්ෂේප කරන තව කෙනෙකු විඤ්ඤාණඤ්චායතනයෙහි ඉපි ද, ඉන් චුතව විනාශයට යේ යැයි කෙනෙක් උච්ඡේද දෘෂ්ටි ගනිති.

06. එය ද ප්‍රතික්ෂේප කරන තව කෙනෙකු ආකිඤ්චඤ්ඤායතනයෙහි ඉපි ද, ඉන් චුතව විනාශයට යේ යැයි කෙනෙක් උච්ඡේද දෘෂ්ටි ගනිති.

07. එය ද ප්‍රතික්ෂේප කරන තව කෙනෙකු සංඥා ඇත්තේ නොවෙයි, නැත්තේත් නොවෙයි යන තරමට ආත්මය සියුම්ව ගිය නෙවසඤ්ඤානාසඤ්ඤායතනයෙහි ඉපි ද ඉන් චුතව විනාශයට යේ යැයි කෙනෙක් උච්ඡේද දෘෂ්ටි ගනිති

**05) දිට්ඨධම්ම නිබ්බාණවාද 05**

මේ ආත්මයේ ම ලබන්නා වූ නිවණක් පිළිබඳ මෙහි දී අවධාරණය කරයි. මේවා 05කි.

01. ඇතැම් මහණ බමුණෙක් මෙලොව පස්කම් සුවය විදීම මෙලොව නිවන ලෙස දක්වයි.

02. තව කෙනෙකු කාමය නිවන යැයි නොපිළිගනිති. ඔවුහු විතර්කයෙන් වෙන්ව ලබන, විතර්ක විචාර පීති සුඛ එකග්ගතා සංඛ්‍යාත ප්‍රථමධ්‍යාන සුවය දිට්ඨ ධම්ම නිබ්බාණය යි දෘෂ්ටි ගනිති.

03. තව කෙනෙකු එය ප්‍රතික්ෂේප කරති. ඕලාරික විතර්ක විචාර සන්සිඳුවා ප්‍රීති සුඛ ඇති ද්විතීය ධ්‍යාන සුඛ මෙලොව නිවන යැයි දෘෂ්ටි ගනිති.

04. තව කෙනෙක් ප්‍රීතිය ද ඕළාරිකයැයි ගෙන එය ද සන්සිඳුවා ස්මෘතිසම්පන්නව උපෙක්ෂා සුඛ විහරණයෙන් තෘතීය ධ්‍යාන සුවය විදිති. එම සුවය මෙලොව නිවනැයි ගනිති.

05. තව කෙනෙක් සුඛය ද ඕළාරිකයැයි සළකා එය ද සන්සිඳුවා ස්මෘතිසම්පන්නව උපෙක්ෂා සුඛ විහරණයෙන් තෘතීය ධ්‍යාන සුවය විදිති. එම සුවය මෙලොව නිවනැයි ගනිති.

මෙම දෘෂ්ටිවාදයන් අතර 32ක් ශාස්වතවාදී වන අතර 07ක් උච්ඡේදවාදයට ඇතුළත් වේ.

මෙම දෙසැටක් මිථ්‍යා දෘෂ්ටි පිළිබඳ විමසීමේදී බුද්ධ කාලීන භාරතයේ පැවති දාර්ශනික සංකල්ප කීපයක් අපට දැකිය හැකිය.

01. ආත්මය පිළිබඳ සංකල්පය.

02. විශ්වය හෙවත් ලෝකය පිළිබඳ සංකල්පය.

03. ඥානෝපාය පිළිබඳ සංකල්පය.

04. නිර්වාණය පිළිබඳ සංකල්පය.

## දෘෂ්ටි පිළිබඳ බෞද්ධ මතය හා බුදුදහමේ අනාත්මවාදය

දෘෂ්ටි ග්‍රහණය බුදුසමයෙන් පූර්ණ ලෙස බැහැර වූවකි. දෘෂ්ටි ග්‍රහණය නිසා සත්‍ය සැඟවී යන බව බුදුරජාණන් වහන්සේ නිරන්තරයෙන් පෙන්වා දී ඇත. දෘෂ්ටිවාදියා සෑම අවස්ථාවකදී ම සිතනුයේ මෙයම සත්‍යය ය, අන් සියල්ල අසත්‍යය ය ලෙසය. එසේම තමක් නිවැරදි ය, අනුන් වැරදි ය ලෙසය. ''***ඉධමෙව සච්චං මොසං අඤ්ඤං මයාං සච්චං තුයාං මුසා***'' ඔහු මෙසේ සිතනුයේ දෘෂ්ටි ග්‍රහණය තුළ ඔහු අන්ධ වී ඇති බැවිනි. එම නිසා ඔහුට කිසි කලෙක සත්‍ය අවබෝධ නොවනු ඇත. වරක් අග්ගිවච්චගොත්ත නම් බ්‍රාහ්මණයා බුදුරජාණන් වහන්සේගෙන් මෙම දාෂ්ටි පිළිබඳ විමසූ අතර, එහිදී බුදුරජාණන් වහන්සේ දෘෂ්ටිය යනු සත්‍ය නොවන්නක් බව අවධාරණය කොට ඇත. ***''දිට්ඨිගතමෙතං දිට්ඨිගහනං දිට්ඨිකන්තාරං දිට්ටි විසූකං දිට්ඨි විප්පන්දිතං දිට්ඨිසඤ්ඤොජනං සදුක්ඛං, යසිඝාතං සඋපායාසං, සපරිළාහං, න නිබ්බිදාය, න විරාගාය, න නිරෝධාය, න උපසමාය, න අභිඤ්ඤාය, න සම්බෝධාය, න නිබ්බාණාය සත්වත්තන්ති.'***[ඩස] එයට හේතුව කුමක්දැයි විමසන අග්ගිවච්චගොත්ත බුදුරජාණන් වහන්සේට කිසියම් වූ දෘෂ්ටියක් ඇත්දැයි ඇසීය. එහිදී බුදුරජාණන් වහන්සේගේ පිළිතුර වූයේ දෘෂ්ටි ග්‍රහණය බුදුරජාණන් වහන්සේ විසින් සපුරා බැහැර කරන ලද බවයි.***''දිට්ඨිගතන්ති ඛො වච්ඡ අලනීතමෙතං තථාගතස්ස...'***[ඩසස] එසේම දාෂ්ටි ග්‍රහණවලින් යුක්තවීම තුළින් විර්‍ය ආරම්භ කිරීමට නොහැකි බව බුදුරජාණන් වහන්සේ ම.නි. මාලුංක්‍යපුත්ත සූත්‍රයේ දී දේශනා කොට ඇත.***''මාලුංක්‍ය පුත්ත දිට්ඨියා සති බ්‍රහ්මචරියවාසො අභවිස්සාති'***[ඩසසස] උන්වහන්සේ ඒ බව දක්වා ඇත්තේ දෘෂ්ටි ග්‍රාහකයා කිසි විටෙක තම දෘෂ්ටිය අතහැර දැමීමට කැමැත්තක් නොදක්වන බැවිනි. එසේම දෘෂ්ටිවලින් යුක්ත අශ්‍රැතවත් පෘථග්ජනයා ජාති, ජරා, මරණ ආදී දුක්වලින් නොමිදෙන බව මජ්ඣිම නිකායේ සබ්බාසව සූත්‍රයේ දක්නට ඇත. ***''දිට්ඨිසංයෝජන සංයුතෙතා භික්ඛවෙ අසසුතවා පෘථුජ්ජනො න පරිමුච්චති ජාතියා ජරා මරණෙහි සොකෙහි පරිදෙවෙහි දුක්ඛෙහි දොමනසසෙහි උපායාසෙහි න පරිමුච්චති දුක්ඛස්මානි වදාමි.'***[සං]

මෙම සියලු දෘෂ්ටින් ප්‍රතික්ෂේප කරන්නා වූ බුදුදහම ඒ සඳහා උගන්වන්නා වූ ධර්මය පටිච්චසමුප්පාද දේශනාවයි. බ්‍රහ්මජාල සූත්‍රයේ අන්තර්ගත කරුණු පිළිබඳ විමසා බැලීමේ දී ඒ සියල්ල ද උක්ත දෘෂ්ටිවාද

ගණයට ඇතුළත් වේ. බුදුරජාණන් වහන්සේ බ්‍රහ්මජාල සූත්‍රයෙන් පෙන්වා දෙන්නා වූ මිථ්‍යා දෘෂ්ටි 62 පිළිබඳ පූර්ණ වශයෙන් විමසීමේ දී එයින් ඉස්මතු වන්නා වූ ප්‍රධාන සංකල්පයක් වේ. එනම් ආත්ම සංකල්පය යි.

මෙම ආත්ම සංකල්පය ප්‍රධාන වශයෙන් එය අන්ත දෙකක් යටතේ විග්‍රහ වී ඇත.

01. ශාස්වත අන්තය

02. උච්ඡේද අන්තය

ශාස්වත අන්තය යනු ආත්මය සදාකාලික බව පිළිගැනීම යි. ශරීරය මිය ගිය ද ආත්මය මිය නොයන බව (***අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරං***) පිළිගන්නා කල මෙම ශාස්වතවාදය නිර්මාණය වේ. නිර්මාණවාදී ආගම් නිත්‍ය ශාස්වත ආත්මයක් පිළිගෙන එය සදාකාලික ස්වර්ගීය ජීවිතයකට පත් කිරීමට උත්සහ ගෙන ඇත. ඔවුන් අභිඥා ආදී වූ නොයෙකුත් ඥාණාධිගමයන් මූලික කොටගෙන මෙම ශාස්වතවාදයට එළඹී ඇත. බ්‍රහ්මජාල සූත්‍රයේ එය,

***''සස්සතො අත්තා ච ලොකො ච වඤ්ඣො කූටට්ඨො එසිකට්ඨායිට්ඨිතො තෙව සත්තා සංධාවන්ති සංසරන්ති චවන්ති උප්පජ්ජන්ති, අත්‍ථිත්වෙව සස්සති සමං''***

වශයෙන් දක්වා ඇත. එබඳු වූ ආත්මය එල උත්පාදනයෙන් තොර බවත්, නිශ්චල බවත්, ඉන්ද්‍රඛීලයක් සේ ස්ථිර බවත් දක්වයි. එසේම උච්ඡේදවාදය යනු ශරීරය සදාකාලික නොවන බවත් එය මරණයෙන් කෙළවර වන බවත් පිළිගැනීමයි. අනවබෝධය නිසාම කය හා මනස එකක් ලෙස සිතූ (***තං ජීවං තං සරීරං***) පිරිස් මෙම උච්ඡේදවාදය ඉදිරිපත් කොට තිබේ. බ්‍රහ්මජාල සූත්‍රයෙහි ද ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණවරු මේ ආත්මය රූපීමය යැයි ද සතර මහාභූත ධර්මයන්ගෙන් සැදුම් ලද්දකැයි ද මව්පිය සබඳතාවෙන් හටගත්තකැයි ද කය විදීමෙන් උච්ඡේදයට පත්වන්නෙකැයි ද එය ආත්මය මැනවින් උච්ඡේදයට පත්වන්නෙකැයි ද යනුවෙන් දක්වා ඇත.

***''ඉධ භික්ඛවෙ එකච්චො සමණො වා බ්‍රාහ්මණො වා එවං වාදී හොති. එවං දිට්ඨී. යතො ඛො භො අයං අත්තා රූපී චාතුම්මහාභූතිකො මාතා පෙත්තික සම්භවො කායස්ස භෙදා උච්ඡිජන්ති. විනස්සන්ති. න හොති පරම්මරණා එත්තාවතා ඛො භො අයං අත්තා සම්මා සමුච්ඡින්නො හො තීති. ඉත්‍ථෙකෙ සතො සත්තස්ස උච්ඡේදං විනාසං විභවං පඤ්ඤාපෙන්ති.''***[ස]

මෙම ශාස්වත උච්ඡේද අන්ත දෙකටම ඇතුළත් නොවන්නා වූ බුදුරජාණන්වහන්සේ පටිච්චසමුප්පාද දේශනාව මූලික කොටගෙන අනාත්මවාදී චින්තනයක් ඉදිරිපත් කළේය. එසේම උන්වහන්සේ සංයුක්ත නිකායේ සමනුපස්සනා සූත්‍රය තුළ යම් බඳු වූ ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ නොයෙක් අයුරකින් ආත්මයක පැවැත්මක් දකින්නේ නම් ඒ සියල්ල පඤ්ච උපාදානස්කන්ධම හෝ ඉන් එක්තරා ස්කන්ධයක් අනුසාරයෙන් හෝ සළකා නිර්මාණය කරගන්නා බව දක්වා ඇත.

***''යෙහි කොචි භික්ඛවෙ සමණා වා බ්‍රාහ්මණා වා අනෙකවිහිතං අත්තානං සමනුපස්සමානා සමනුපස්සන්ති. සබ්බේ තෙ පංචුපාදානක්ඛන්ධෙ සමනුපස්සන්ති. එතෙසංවා අඤ්ඤතරං වා''***[සස]

[i] දී.නි. බ්‍රහ්මජාල සුත්ත, බු.ජ.මු. 3-4 පි.
[ii] දී.නි. බ්‍රහ්මජාල සුත්ත, බු.ජ.මු. 4-5 පි.
[iii] දී.නි. බ්‍රහ්මජාල සුත්ත, බු.ජ.මු. 6-10 පි.
[iv] දී.නි. බ්‍රහ්මජාල සුත්ත, බු.ජ.මු. 10-15 පි.
[v] දී.නි. බ්‍රහ්මජාල සුත්ත, බු.ජ.මු. 20 පි.
[vi] ම.නි. අග්ගිවච්ඡගොත්ත සුත්ත, බු.ජ.මු. 260 පි.
[vii] ම.නි. අග්ගිවච්ඡගොත්ත සුත්ත, බු.ජ.මු. 260 පි.
[viii] ම.නි. මාලුංක්‍යපුත්ත සුත්ත බු.ජ.මු. 158 පි.
[ix] ම.නි. සබ්බාසව සුත්ත බු.ජ.මු. 22 පි.
[x] දී.නි. බ්‍රහ්මජාල සුත්ත, බු.ජ.මු. 22 පි.
[xi] දී.නි. බ්‍රහ්මජාල සුත්ත, බු.ජ.මු. 60පි.
[xii] සං.නි. සමනුපස්සනා සුත්ත බු.ජ.මු. 82පි.